# මධ්‍යම පරිසර අධිකාරිය
# மத்திய சுற்றாடல் அதிகாரசபை
# Central Environmental Authority

"පරිසර පියස", 104, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
"பரிசர பியச", 104, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை, இலங்கை.
"Parisara Piyasa", 104, Denzil Kobbekaduwa Mawatha, Battaramulla, Sri Lanka . Web : www.cea.lk


අපේ යොමුව / எமது தொடர்பு / Our Ref. } CEA/06/EPU/PR/39/2023

ඔබේ යොමුව / உமது தொடர்பு / Your Ref. }

දිනය / திகதி / Date } 2023.08.23

## මාධ්‍ය නිවේදනය

### පරිසරය රකින්න තවත් ගැසට් දෙකක්....

**තවත් තනි භාවිත ප්ලාස්ටික් අයිතම 09ක් තහනම්.....**

**"හාලිඇල ජල මූලාශ්‍ර රක්ෂිත" පාරිසරික ආරක්ෂක ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරයි.....**

- **තවත් තනි භාවිත ප්ලාස්ටික් අයිතම 09ක් තහනම්.....**

1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත මගින් පරිසර අමාත්‍ය නසීර් අහමඩ් මහතාට ලැබී ඇති බලතල ප්‍රකාරව 2023 ජූලි මස 19 වන දිනැති අංක 2341/30 දරන ගැසට් පත්‍රය මගින් තනි භාවිත ප්ලාස්ටික් අයිතම 09ක් රට තුළ භාවිතය සඳහා වන යම් ක්‍රියාවලියක්, වෙළෙඳාමක් හෝ කර්මාන්තයක් සඳහා යොදාගැනීම තහනම් කර ඇත.

ඒ අනුව, තනි භාවිත ප්ලාස්ටික් බීම බට සහ කලතන; තනි භාවිත ප්ලාස්ටික් පිඟන්, කෝප්ප, හැඳි, ගෑරුප්පු සහ පිහි; ප්ලාස්ටික් මල් මාලා; ප්ලාස්ටික් ඉඳි ආප්ප වට්ටි යන අයිතම 2023 ඔක්තෝම්බර් මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි තහනමට ලක්වේ. මේ අනුව මෙම දිනයෙන් පසු උක්ත අයිතම රට තුළ නිෂ්පාදනය, දේශීය භාවිතය සඳහා ආනයනය, විකිණීම, විකිණීම සඳහා අර්පණය, විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම, නොමිලයේ පිරිනැමීම හෝ ප්‍රදර්ශනය කිරීම තහනම් වන අතර තහනම කඩ කළහොත් ජාතික පාරිසරික පනතේ විධිවිධාන ප්‍රකාරව නීතිය ක්‍රියාත්මක කරනු ලැබේ.

ප්ලාස්ටික් මගින් සිදුවන අතිවිශාල පරිසර දූෂණය වැළැක්වීම සඳහා සියලු දෙනා එක්ව කටයුතු කිරීම යුගයේ අවශ්‍යතාවකි. ඒ අනුව, මෙම තහනම පනවනු ලැබුයේ ද අත්‍යවශ්‍ය නොවන ප්ලාස්ටික් අයිතම භාවිතය සහ ඒ ආශ්‍රිතව පැන නගින පාරිසරික ගැටලු අවම කර ජීවීන් ඇතුළු පරිසරය රැකගැනීමට පිටිවහලක් ලබාදීමේ අරමුණෙනි. එමෙන්ම පරිසර හිතකාමී විකල්ප ආශ්‍රිත දේශීය කර්මාන්ත ප්‍රවර්ධනය සඳහා ද ප්ලාස්ටික් ආනයනයේදී විදේශ විනිමය අඩුකර ගැනීමට ද මින් පිටිවහලක් සැලසේ.

- **"හාලිඇල ජල මූලාශ්‍ර රක්ෂිත" පාරිසරික ආරක්ෂක ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරයි.....**

බදුල්ල දිස්ත්‍රික්කයේ හාලිඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තේ වතු ඉඩම්වල පිහිටි ජල මූලාශ්‍ර රක්ෂිත ඉඩම් කැබලි 362කින් සමන්විත භූමි ප්‍රදේශය 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත මගින් පරිසර අමාත්‍ය නසීර් අහමඩ් මහතාට ලැබී ඇති බලතල ප්‍රකාරව 2023 ජූනි මස 09 වන දිනැති අංක 2335/21 දරන ගැසට් පත්‍රය මගින් **"හාලිඇල ජල මූලාශ්‍ර රක්ෂිත පාරිසරික ආරක්ෂක ප්‍රදේශය"** යන නමින් පාරිසරික ආරක්ෂක ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කර ඇත.

බදුලු ඔය පෝෂණය කරන කුඩා දිය පහරවල් වෙත ජලය ලැබෙන්නා වූ ජල මූලාශ්‍ර මෙම ප්‍රදේශයේ පිහිටා තිබේ. එම ජල මූලාශ්‍ර ආරක්ෂා කිරීම ජාතික අවශ්‍යතාවක් ලෙස සලකා සංරක්ෂණය සහ නීතිමය රැකවරණයක් ලබාදීමේ අරමුණින් මෙම ප්‍රදේශය පාරිසරික ආරක්ෂක ප්‍රදේශයක් ලෙස නම් කිරීමට කටයුතු කරන ලදී.

ඒ අනුව, මින් ඉදිරියට "හාලිඇල ජල මූලාශ්‍ර රක්ෂිත පාරිසරික ආරක්ෂක ප්‍රදේශය" තුළ සිදු කළ හැක්කේ අවසරලත් භාවිතයන් පමණක් වන අතර ඒවා ද ගැසට් පත්‍රයේ සඳහන් කොන්දේසිවලට යටත්ව සිදුකළ යුතුවේ. ජල මූලාශ්‍ර රක්ෂිත ප්‍රදේශය වැඩි දියුණු කිරීම සඳහා සිදුකරන රුක් රෝපණ වැඩසටහන්, ග්‍රාමීය ප්‍රජාවට පානීය ජලය සපයනු ලබන ප්‍රජා මූලික ජල සැපයුම් ව්‍යාපෘති සහ හාලිඇල පාරිසරික ආරක්ෂක ප්‍රදේශයේ තිරසාර පැවැත්මට අදාළ ක්‍රියාකාරකම් මෙලෙස අවසර ලත් භාවිතයන් ලෙස ප්‍රකාශයට පත් කර ඇත.

ජාතික පාරිසරික පනතට අනුව, පාරිසරික වශයෙන් සුවිශේෂී ප්‍රදේශ පාරිසරික ආරක්ෂක ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කිරීම සිදු කෙරෙන අතර, එම ප්‍රදේශ වල දිගු කාලීන තිරසර පැවැත්ම තහවුරු කිරීම සඳහා නියාමනය කිරීම සිදු කරනු ලැබේ. ඒ අනුව, මේවන විට ශ්‍රී ලංකාව තුළ පාරිසරික ආරක්ෂක ප්‍රදේශ දහයක් නම් කර ඇති අතර "හාලිඇල ජල මූලාශ්‍ර රක්ෂිත පාරිසරික ආරක්ෂක ප්‍රදේශය" එකළොස් වැනි පාරිසරික ආරක්ෂක ප්‍රදේශයයි.

මාධ්‍ය සම්බන්ධීකරණය - මාධ්‍ය නිලධාරී - ශ්‍රියාන්ජනී ලොකුලියන - 0776252288

පී. බී. හේමන්ත ජයසිංහ
අධ්‍යක්ෂ ජනරාල්
මධ්‍යම පරිසර අධිකාරිය